ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2024.12.24

ආර්.ජී.මොහාන් ඉසුරු කුමාර
අංක 328/5ඒ
රෝහල හන්දිය
පොළොන්නරුව

**පැමිණිලිකරු**

ආර්.ජී.ඉසලි ෂෙලිනා

**වින්දිත දැරිය**

01. යූ.අනූෂා ප්‍රියංගනී ජයතිලක
    උප ගුරු
    පො/තෝපාවැව ජාතික පාසල
    පොළොන්නරුව

02. ඩී.යූ.උපාලි දිසනායක
    විදුහල්පති
    පො/තෝපාවැව ජාතික පාසල
    පොළොන්නරුව

**වගඋත්තරකරුවන්**

**පැමිණිලි අංකය: HRC/ANU/603/2023(A)**

**පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම**

පැමිණිලිකාර මොහාන් ඉසුරු යන අය විසින් 2023.09.11 දිනැති පැමිණිල්ල මගින් ප්‍රකාශ කර සිටින්නේ, තම දියණිය වන ආර්.ජී. ඉසලි ෂෙලිනා යන අය පොළොන්නරුව තෝපාවැව ජාතික පාසලේ 1-බී ශ්‍රේණියේ ඉගෙනුම ලබමින් සිටියදී 2023.08.07 වන දින පන්තිභාර ගුරුතුමියගේ පහරදීමකට ලක්ව ඇති බවයි. එලෙස 2023.08.07 වන දින සිදුවූ පහරදීම හේතුකොට ගෙන දරුවා අසනීප ගතියක් පෙන්නුම් කළ බැවින් දරුවා රෝහල්ගත කළ බවත්, රෝහලේදී දරුවාගෙන් රෝහල්



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

පොලිසිය විසින් ප්‍රකාශයක් සටහන් කරගෙන තිබෙන බවත් කියා සිටියි. එමෙන්ම තම දරුවාට සිදුවූ පහරදීම සම්බන්ධයෙන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් ඇතුළු රාජ්‍ය නිලධාරීන්ද දැනුවත් කර ඇතිමුත් කිසිදු සාධාරණයක් ඉටුනොවූ බව ද පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත.

දරුවාට සිදුවූ පහරදීම හේතුකොට ගෙන තමා විසින් විදුහල්පති, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් ඇතුළු නිලධාරීන්ට සිදු කළ පැමිණිලි මත පදනම්ව තම දරුවා වෙනත් පාසලක් වන සිවලී මහා විද්‍යාලයට ඇතුලත් කර ගන්නා ලෙසට තමාට දන්වන ලද බවත්, පො/ තෝපාවැව විදුහලේ විදුහල්පති විසින් තම දරුවා පාසලට භාරගත නොහැකි බවට දන්වමින් බැන තර්ජනය කළ බවත් පැමිණිලිකරු විසින් දක්වා ඇත. මේ සම්බන්ධයෙන් සොයා බලා සාධාරණය ඉටුකර දෙන ලෙස පැමිණිලිකරු සිය පැමිණිල්ල තුළින් ඉල්ලා සිටියි.

<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් වාර්තාවක් කැඳවීම සඳහා 2023.11.30 වන දින විදුහල්පති, තෝපාවැව ජාතික පාසල, පොළොන්නරුව වෙත ලිපියක් යොමුකර ඇති අතර, එම ලිපියට 2 වන වගඋත්තරකරු විසින් පිළිතුරක් ලබානොදුන් බැවින් වගඋත්තරකරුවන් කැඳවා 2023.12.19 දින පෙ.ව.10.00ට පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු සිදුකරන ලද අතර, එම පරීක්ෂණය සඳහා ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන් දෙදෙනා කැඳවීමට ද කටයුතු කරන ලදී.

කරුණු මෙසේ තිබියදී 2 වන වගඋත්තරකරු වන පො/ තෝපාවැව ජාතික පාසලේ විදුහල්පති විසින් පැමිණිල්ලට අදාල 2023.12.11 දිනැති වාර්තාව කොමිෂන් සභාව වෙත එවා ඇති අතර, එම වාර්තාව මගින් ඔහු දන්වා සිටින්නේ, පැමිණිලිකරු වන මොහාන් ඉසුරු කුමාර යන අය විසින් කොමිෂන් සභාවට අසත්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බවත්, හිතාමතාම පළිගැනීමේ චේතනාවෙන් මෙම පැමිණිල්ල ඉදිරිපත් කර ඇති බවත්ය.

පැමිණිල්ලේ සඳහන් සිදුවීම 2023.08.10 දින 1-බී පන්තියේ දී සිදුවී ඇති බවත්, පැමිණිලිකරු මෙකී සිදුවීම පිළිබඳව 2023.08.14 දින තමා සමග සාකච්ඡා කළ බවත්, ඒ අනුව එදිනම පැමිණිලිකරුගේ දියණිය වන ආර්.ජී. ඉසලි ෂෙලිනා යන අය 1-සී පන්තිය වෙත මාරුකළ බවත් 2 වන වගඋත්තරතරු විසින් සිය වාර්තාව තුළින් දක්වා ඇත.

එලෙස 1-සී පන්තියට දරුවා මාරු කිරීම පැමිණිලිකරු ප්‍රතික්ෂේප කළ බැවින් 1-ඒ පන්තිය වෙත දරුවා මාරු කිරීමට යාමේදී පන්තිභාර ගුරුතුමිය නවක ගුරුවරියක් වන බැවින් ඇය බියට පත්වූ බවත්, එකී ගැටළුව නිරාකරණය කිරීමේදී තමාදුන් උපදෙස් පැමිණිලිකරු විසින් නොතැකීම හේතුවෙන් පැමිණිලිකරු සමඟ වචන හුවමාරුවක් සිදුවූ බවත් 2 වන වගඋත්තරතරු විසින් සිය වාර්තාව තුළින් සඳහන් කර ඇත.

පසුව මානව හිමිකම් කොමිෂන් සභාවේ දැනුම්දීමකට අනුව දිසාපති කාර්යාලයේ දී සියලුදෙනාගේ (අතිරේක දිසාපති, පොළොන්නරුව පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා කාර්යාංශය) මැදිහත්වීමෙන් ගැටළුව නිරාකරණය කරන ලද බවත්, පැමිණිලිකරුගේ දරුවා පොළොන්නරුව ජනාධිපති ප්‍රාථමික විද්‍යාලයට ඇතුළත් කිරීමට යෝජනා කළ බවත්, පැමිණිලිකරු ද ඊට එකග වූ බවත් 2 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත. තවද, පැමිණිලිකරු දරුවා ඇපයට තබාගෙන රාජ්‍ය නිලධාරීන් සියලු දෙනාගෙන් පළිගැනීමට උත්සහ දරන බැවින් ඔහු හට කිසියම් මානසික ගැටළුවක් ඇති ස්වාභාවයක් පෙන්නුම් කරන බවත්, එම හේතුව නිසා දරුවා පාසල් නොයවන තත්ත්වයක් ඇති බවත් 2 වන වගඋත්තරතරු විසින් වැඩිදුරටත් සිය වාර්තාව තුළින් දක්වා ඇත.

2023.12.19 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරික්ෂණයේදී 2 වන වගඋත්තරකරු වන විදුහල්පති ඩී.යූ.උපාලි දිසානායක ප්‍රකාශ කර ඇත්තේ 2023.08.10 දින අදාල සිදුවීම සිදුවූ බවත්, එදින 1-බී පන්තිය භාරව කටයුතු කරන ලද්දේ 1 වන වගඋත්තරකාරිය වන යූ.අනූෂා ප්‍රියංගනී ජයතිලක මිය වන බවත්, මෙම පැමිණිලිකරුගේ දරුවාට සිදුවූ පහරදීම අනුව තම දරුවා අසනීප තත්ත්වයෙන් පසුවන බව පැමිණිලිකරු විසින් තමාට දැනුම් දුන් බවත් ය. එමෙන්ම පැමිණිලිකරුගේ 2023.08.17 දිනැති ලිපිය මගින් තම දරුවා වෙනත් පන්තියකට මාරුකර දෙන ලෙස ඉල්ලා ඇති බවත්, ඒ අනුව පැමිණිලිකරුගේ දරුවා 1-සී පන්තියට මාරුකළ බවත්, මෙම දරුවා පාසලට භාර ගැනිමට නොහැකි බවට ප්‍රකාශයක් නොකළ බවත් 2වන වගඋත්තරකරු විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

2 වන වගඋත්තරකරු වන විදුහල්පතිවරයා විසින් ප්‍රකාශ කර සිටින්නේ, විශේෂඥ මනෝ වෛද්‍යවරයා විසින් ලබාදී ඇති නිර්දේශය සමග පැමිණිලිකරු දරුවා පාසලට රැගෙන ආ බවත්, ඒ අනුව දරුවා පන්තියකට ඇතුළත් කිරීම සඳහා ගුරුවරියන් තිදෙනා කැඳවූ බවත්, ඒ අවස්ථාවේ පැමිණිලිකරු ආවේගශීලීව හැසිරුනු බවත්, ගුරුවරියන් බියට පත්වූ බවත් ය.

2023.12.19 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේදී පැමිණිලිකරුගේ දරුවාට පහරදීමක් සිදුකල බවට පැවසෙන 1-බී පන්තිභාර ගුරුවරිය වන 1 වන වගඋත්තරකාර යූ.අනූෂා ප්‍රියංගනී ජයතිලක යන අය විසින් ප්‍රකාශ කර සිටින්නේ, තමා පැමිණිලිකරුගේ දරුවාට කිසිදු පහරදීමක් සිදු නොකළ බවයි. එමෙන්ම 2023.08.10 දින දරුවා දවල් 12.00ට පමණ පාසල නිමවී නිවසට ගිය බවත්, පසු දින පාසලට නොපැමිණි බවත්, පැමිණිලිකාර පියා 2023.08.14 දින විද්‍යාලයේ විදුහල්පතිට තම දරුවා හට  පහරදිමක් සිදු කිරීම පිළිබඳව පැමිණිලිකර ඇති බවත් 1 වන වගඋත්තරකාරිය විසින් ප්‍රකාශ කර ඇත.

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් මූලස්ථාන පොලීසිය, පොළොන්නරුව වෙතින් වාර්තාවක් කැඳවා ඇති අතර, මූලස්ථාන ප්‍රධාන පොලිස් පරික්ෂකගේ අංක 6163/23 හා 2023.12.29 දිනැති වාර්තාව මගින් ප්‍රකාශ කර සිටින්නේ, පැමිණිලිකරුගේ දියණිය වන තෝපාවැව ජාතික පාසලේ 1-බී පන්තියේ

ඉගෙනුම ලබන ආර්.ජී.ඉසලි ෂෙලීනා දැරියට 2023.08.10 දින පන්තිභාර ගුරුවරිය විසින් අතින් සිදු කළ පහරදීමක් සම්බන්ධයෙන් ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පොළොන්නරුව රෝහල වෙත යොමුවී ඇති බවත්, රෝහල් පොලීසිය විසින් දැරියගෙන් ප්‍රකාශයක් සටහන් කර ගැනීමෙන් පසුව 2023.08.13 දින පැමිණිල්ල තමා වෙත යොමුකර ඇති බවත් ය.

එසේම, 2023.08.13 දින ලද පැමිණිල්ල සම්බන්ධයෙන් ප්‍රමාදයකින් තොරව පොලිස් විමර්ශන ආරම්භ කරන ලද බවත්, 2023.08.11 දින රෝහලේදී දැරිය විසින් ලබාදුන් ප්‍රකාශය අංක 406/23 යටතේ ලේඛනගත කර ඒ වන විට පළමු වාරයේ පාසල් නිවාඩුව ආරම්භ කර ඇති බැවින් දෙපාර්ශවයේ එකගතාවය මත පැමිණිල්ල විභාගය සඳහා 2023.08.19 දින දෙපාර්ශවය පොලීසිය වෙත කැඳවූ බවත් ඉහත කී මූලස්ථාන ප්‍රධාන පොලිස් පරික්ෂකගේ වාර්තාව තුළ සඳහන් කර ඇත. මෙම පැමිණිලි විභාගයේදී විදුහල්පතිට හෝ පන්තිභාර ගුරුවරියට එරෙහිව ක්‍රියා මාර්ග ගැනීමට අවශ්‍ය නොවන බවත්, තම දරුවා 1-ඒ පන්තියට ඇතුලත් කර දෙන ලෙසට ඉල්ලීමක් කරන ලද බවත්, වෙනත් වැඩකට යන්න අවශ්‍යව ඇති බව දන්වා පැමිණිලිකරු ප්‍රකාශයක් ලබානොදී ස්ථානයෙන් පිටව ගිය බවත් එකී වාර්තාවේ දක්වා ඇත. එදිනම එනම්, 2023.08.19 වන දිනම පැය 16.40ට පැමිණිලිකරු පොලීසිය වෙත පැමිණ මෙදින පැවති පැමිණිලි විභාගය සඳහා දරුවාගේ පන්තියේ දෙමාපියන් කිහිප දෙනෙකු පොලිස් ස්ථානය වෙත පැමිණ ඇති බැවින් දෙමාපියන් නොමැතිව පරික්ෂණයක් සිදුකරන ලෙසට ප්‍රකාශ කරන ලද බවත්, මෙකී කාලය තුළ ගුරුවරුන් තිදෙනෙකු හා විදුහල්පති විසින් සිදුකල බැන වැදීමක් සම්බන්ධ පැමිණිල්ලක් පැමිණිලිකරු විසින් පොලීසිය වෙත කර ඇති බවත්, පැමිණිලිකරු මෙකී පැමිණිලි විභාගය සඳහා පොලීසිය වෙත පැමිණ නැති බවත් ඉහත කී වාර්තාව තුළින් දක්වා ඇත.

එසේම, පැමිණිලිකරු පැමිණිලි විභාගය සඳහා පොලීසියට නොපැමිණීම හේතුවෙන් විදුහල්පති සමග සාකච්ඡා කොට පැමිණිලිකරුගේ දරුවා 1-ඒ පන්තිය වෙත මාරු කිරීම සඳහා කාන්තා ප්‍රධාන පොලිස් පරික්ෂක වනිගසේකර නිලධාරිනිය විසින් මැදිහත්වීමක් සිදුකර ඇති නමුත් පැමිණිලිකරු මෙකී මැදිහත්වීම අනුව කටයුතු කර නොමැති බවත් එකී වාර්තාවේ වැඩිදුරටත් සඳහන් කර ඇත.

තවද, මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් මූලස්ථාන පොලීසිය, පොළොන්නරුව මගින් ස්ථානීය පරික්ෂණයක් සිදුකර ඇති බවත්, එකී ස්ථානීය පරික්ෂණය අනුව පන්ති කාමරයේ සිටි ළමුන් තිදෙනෙකුගෙන් සාක්ෂි සටහන් කර ගෙන ඇති බවත්, එකී විමර්ශනයෙන් අනතුරුව මෙම සිදුවීම සම්බන්ධයෙන් 2023.09.13 වන දින අංක පො.ම/උ බී912/23/1 යටතේ අධිකරණය වෙත කරුණු වාර්තා කළ බවත්, පහරදීමට අදාල වගඋත්තරකාරිය වන පොළොන්නරුව තෝපාවැව විදුහලේ සේවය කරන අනුෂා ප්‍රියංගනී ජයතිලක යන අය 2023.10.10 දින අත්අඩංගුවට ගත් බවත්, අංක ම/උ 912/23/01 යටතේ වැඩිදුර වාර්තාවක් මගින් අධිකරණය වෙත ඉදිරිපත් කළ බවත් ඉහත කී වාර්තාව තුළින් දක්වා ඇත.

එමෙන්ම, මෙම පැමිණිලිකරුගේ දරුවා මේවන විට පොළොන්නරුව තෝපාවැව ජාතික පාසලේ 1-ඒ ශ්‍රේණියට ඇතුලත්ව අධ්‍යාපනය ලබමින් සිටින බවද එම වාර්තාවේ සඳහන් කර ඇත.

**නිරීක්ෂණ**

පැමිණිලිකරු තම පැමිණිල්ල මගින් ප්‍රකාශ කර සිටින්නේ, පැමිණිලිකරුගේ දියණිය වන ඉසලි ෂෙලිනා යන අය 1-බී ශ්‍රේණියේ ඉගෙනුම ලබමින් සිටියදී පන්තිභාර ගුරුතුමිය විසින් පහරදීමක් සිදුකර ඇති බවත්, එකී පහරදීම හේතුවෙන් තම දියණියගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් සිදුව ඇති බවත් ය.

1-බී ශ්‍රේණියේ පන්තිභාර ගුරුවරිය ලෙස කටයුතු කළ 1 වන වගඋත්තරකාරිය ප්‍රකාශ කර සිටින්නේ, තමා පැමිණිලිකරුගේ දරුවාට පහරදීමක් සිදුනොකළ බවයි.

පැමිණිලිකරුගේ වයස අවුරුදු 06ක් වූ දියණිය පොළොන්නරුව තෝපාවැව ජාතික පාසලේ 1-බී ශ්‍රේණියේ ඉගෙනුම ලැබීම සඳහා 2023.08.10 දින පාසලට ගිය බවත්, මෙදින පාසල නිමවී ගෙදර පැමිණි පසු දරුවා වරින් වර වමනය කළ බවත්, ඒ අනුව දරුවා රෝහල්ගත කළ බවත්, රෝහලේදී දරුවා විසින් ඇයට පාසලේදී පන්තිභාර ගුරුතුමිය විසින් ඔළුවට හා පිටට පහරදීම් සිදුකළ බවට වෛද්‍යවරුන්ට පවසා ඇති බවත්, මෙම පහරදීම පිළිබඳව පැමිණිලිකරු තෝපා වැව ජාතික පාසලේ විදුහල්පති වෙත 2023.08.14 දින පැමිණිලි කරන ලද බවත් පැමිණිලිකරු කියා සිටියි.

පැමිණිලිකරුගේ මෙකී පැමිණිල්ලේ සඳහන් කරුණු සම්බන්ධයෙන් 2023.12.19 වන දින කොමිෂන් සභාවේ පැවති පරීක්ෂණයේදී වින්දිත ඉසලි ෂෙලිනා දියණියගේ පන්තිභාර ගුරුවරිය වන 1 වන වගඋත්තරකාරිය විසින් ප්‍රකාශ කර ඇත්තේ, මෙම දරුවා 2023.08.10 දින තමාගේ පන්තියේ ඉගෙනුම ලබමින් සිටිය බවත්, එලෙස පන්තියේ ඉගෙනුම ලබා 2023.08.10 දින පාසල නිම වී දහවල් 12.00ට පමණ පාසලෙන් පිටවී ගිය බවත්, තමා දරුවාට කිසිදු පහරදීමක් සිදුකර නැති බවත් ය. එමෙන්ම, තමා පැමිණිලිකරුගේ දරුවාට පහරදීමක් සිදුකර ඇති බවට 2023.08.14 දින පැමිණිලිකරු විසින් විදුහල්පතිට පැමිණිල්ලක් කර ඇති බවත්, දින 04කට පසු එලෙස විදුහල්පතිට පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම තමා පිළිනොගන්නා බවත් 1 වන වගඋත්තරකාරිය විසින් ප්‍රකාශ කර ඇත.

එයට පිළිතුරු ලෙස පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත්තේ, 2023.08.10 දින තමා දරුවා රැගෙන ඒමට පාසල වෙත ගිය බවත්, දරුවා පාසලෙන් තමාගේ භාරයට ගන්නා විට දරුවා වමනය කළ බවත්, එම අවස්ථාවේදී තමාට පන්තිභාර ගුරුවරිය විසින් පහරදීමක් සිදුකළ බවට දරුවා නොපැවසූ බවත් ය. දරුවාට වමනය දිගටම තිබූ බැවින් දරුවා රෝහල්ගත කළ බවත්, දරුවා රෝහලේදී පන්තිභාර ගුරුවරිය විසින් පහරදුන් බව වෛද්‍යවරයාට ප්‍රකාශ කර ඇති බවත්, පන්තිභාර ගුරුවරිය තම දියණියට පහරදී ඇති බව එම අවස්ථාවේදී දැනගත් බවත්, ඒ අනුව දරුවාගේ වෛද්‍ය ප්‍රතිකාර වලින් පසුව විදුහල්පති වෙත මේ බව පැමිණිලි කළ බවත් ය.

පැමිණිලිකරුගේ දරුවා වන ආර්.ජී.ඉසලි ෂෙලිනා යන අයගේ අංක 136/23 සහ 2023.08.11 දිනැති පොළොන්නරුව මහ රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරී විසින් නිකුත් කර ඇති අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව දරුවා 2023.08.11 වන දින රෝහලට ඇතුලත් කර ඇති අතර, 2023.08.11 දිනම අධිකරණ වෛද්‍ය පරීක්ෂණය සිදුකර ඇති බව ද නිරීක්ෂණය වේ.

ඉහත කී වින්දිත දරුවා වන ආර්.ජී.ඉසලි ෂෙලිනා යන අය විසින් වෛද්‍යවරයා වෙත ප්‍රකාශයක් ලබා දී ඇති අතර, එම ප්‍රකාශය මගින් තමාට 2023.08.10 වන දින පන්තිභාර ගුරුතුමිය වන අනුෂා යන අය විසින් පහරදීමක් සිදුකළ බව ප්‍රකාශ කර ඇත.
වින්දිත දැරිය වන ආර්.ජී.ඉසලි ෂෙලිනා යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාවේ "තුවාලයේ ස්වාභාවය, ප්‍රමාණය, හැඩය, දිසාව සහ ස්ථානය" යටතේ පහත පරිදි සටහන් කර ඇති බව නිරීක්ෂණය වේ.

01. There were no external injuries on the body.

02. Child was conscious and rational at the time of the examination

- Opinion - Given history of assault cannot be excluded.

මේ අනුව වින්දිත දැරිය වන ආර්.ජී.ඉසලි ෂෙලිනා යන අයගේ ශරීරයේ බාහිර තුවාල කිසිවක් නිරීක්ෂණය නොවුණ ද, ඇය විසින් තමාට පහරදීමක් සිදු වූ බවට සිදු කළ ප්‍රකාශය බැහැර කළ නොහැකි බව අධිකරණ වෛද්‍යවරයා විසින් දක්වා තිබීමෙන් ඇයට රෝහල්ගතව ප්‍රතිකාර ලැබීමට එම පහරදීම හේතු වූ බවට පැමිණිලිකරු ඉදිරිපත් කර ඇති කරුණු බැහැර කළ නොහැකි බව පෙනී යයි.

2023.08.10 වන දින දරුවාට සිදුවූ පහරදීම හේතුකොට ගෙන දරුවාට ඇතිව තිබූ මානසික අවපීඩනයක් හේතුවෙන් පැමිණිලිකරු දරුවාව විශේෂඥ මනෝ වෛද්‍යවරයෙකු වෙතද ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වන අතර, විශේෂඥ මනෝ වෛද්‍යවරයා විසින් 2023.09.05 දිනැති ලිපිය මගින් පොළොන්නරුව තෝපාවැව ජාතික පාසලේ විදුහල්පති වෙත යොමු කරමින් වින්දිත දරුවා වන ආර්.ජී.ඉසලි ෂෙලිනා යන අය ළමා මානසික අවපීඩනයෙන් පෙළෙන බවත්, දරුවා පාසල් යාමට දැඩි අකමැත්තක් දක්වන බවත්, පන්තිභාර ගුරුවරියට දැඩි බියක් දක්වන බවත්, මෙම ගැටළු දැරියගේ මානසික යහපැවැත්මට ගැටළුකාරී වන බැවින් වෙනත් පන්තියකට මාරු කිරීම සුදුසු බවට නිර්දේශ කරන බවත් දන්වා ඇති බව ද නිරීක්ෂණය වේ.

1වන වගඋත්තරකාර ගුරුවරිය විසින් දරුවාට සිදුකළ පහරදීම සම්බන්ධයෙන් දරුවා රෝහල්ගතවූ පසු පොලිසිය විසින් 2023.08.11 වන දින වින්දිත දැරිය වන ආර්.ජී.ඉසලි ෂෙලිනා යන අයගෙන් ප්‍රකාශයක් ලබාගෙන ඇති බවත්, එහිදී තමා පොළොන්නරුව තෝපාවැව ජාතික පාසලේ 1 වසර බී පන්තියේ ඉගෙනුම ලබන බවත්, 2023.08.11 වන දින මූර්ධජ ණ යන්න වැරදි ලෙස ලිවීම නිසා අනුෂා ගුරුවරිය විසින් තමාගේ ඔළුවට හා පිටට පහරදුන් බවත් ප්‍රකාශ කර ඇති බව පොළොන්නරුව

පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා කාර්යාංශයේ දෛනික තොරතුරු සටහන් (2) පොතෙහි පිටුව 91 සහ ඡේදය 109 යටතේ යොදා ඇති සටහන අනුව පෙනී යයි.

එකී ප්‍රකාශය පදනම්ව පොලිස් විමර්ශනයක්ද ආරම්භ කර ඇති බවත්, පොළොන්නරුව මූලස්ථාන පොලිසිය විසින් මෙම පහරදීම සම්බන්ධයෙන් දින 08කට පසුව එනම්, 2023.08.19 දින පෙ.ව.10.0ට 1 වන වගඋත්තරකාර ගුරුවරියගෙන් ප්‍රකාශයක් සටහන් කරගෙන ඇති බවත්, එහිදී ගුරුවරිය විසින් එකී පහරදීම ප්‍රතික්ෂේප කර ඇති බවත් පොළොන්නරුව පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා කාර්යාංශයේ දෛනික තොරතුරු සටහන් (2) පොතෙහි පිටුව 142 සහ ඡේදය 164 යටතේ යොදා ඇති සටහන අනුව නිරික්ෂණය වේ.

එදිනම එනම්, 2023.08.19 වන දින පැය 13.20 ට පැමිණිලි විභාගයක් සඳහා පැමිණිලිකරු දුරකථනය මගින් සම්බන්ධ කර ගනිමින් පොලීසිය වෙත කැඳවා ඇති බවටත්, එහිදී පැමිණිලිකරු අදාල ගුරුවරියට හෝ විදුහල්පතිවරයාට එරෙහිව නීතිමය ක්‍රියා මාර්ග ගැනීම අවශ්‍යා නොවන බවටත්, දරුවා වෙනත් පන්තියකට මාරු කිරිමට අවශ්‍යා කටයුතු සලසා දෙන ලෙසට දන්වා පොලිස් ස්ථානයෙන් පිටව ගිය බවටත් පොළොන්නරුව පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා කාර්යාංශයේ දෛනික තොරතුරු සටහන් (2) පොතෙහි පිටුව 149 සහ ඡේදය 170 යටතේ යොදා ඇති සටහන අනුව නිරික්ෂණය වේ. එසේවුවද, මෙලෙස පැමිණිලිකරු ප්‍රකාශ කළ බවට සනාථ කිරීම සඳහා එකී සටහන සඳහා ඔහුගෙන් අත්සනක් ලබාගෙන නොමැති බව ද පෙනී යයි.

එසේවුවද, එදිනම එනම්, 2023.08.19 වන දින පැය 16.40ට පොළොන්නරුව මූලස්ථාන පොලීසිය විසින් පැමිණිලිකරුගෙන් ප්‍රකාශයක් සටහන් කරගෙන ඇති බවත්, මෙකී ප්‍රකාශය මගින් පැමිණිලිකරු තම දරුවාට සිදුකල පහරදීම පිළිබද පැමිණිල්ල විභාග කිරිම සඳහා තම දැරිය සමග පොලිසියට පැමිණෙන ලෙස දැන්වූ බවත්, එසේ පැමිණෙන විට දරුවාට පහරදීම සිදුකල ගුරුවරිය දෙමාපියන් පිරිසක් ද සමඟ පොලිසියට පැමිණ සිටි නිසා ඔහු එම අවස්ථාවේදී අපහසුතාවයට පත් වූ බවත්, පැමිණිලිකරුට දෙමාපියන් සමග ප්‍රශ්නයක් නොමැති බවත්, දරුවාට පහරදීම සිදුකළ ගුරුවරිය සමග පමණක් පැමිණිලි විභාගය සිදුකරන ලෙසට ප්‍රකාශ කළ බවත් පොළොන්නරුව පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා කාර්යාංශයේ දෛනික තොරතුරු සටහන් (2) පොතෙහි පිටුව 150 සහ ඡේදය 171 යටතේ යොදා ඇති සටහන අනුව නිරික්ෂණය වේ.

මෙකී ප්‍රකාශය අනුව නිරීක්ෂණය වන්නේ, 2023.08.10 දින පැමිණිලිකරුගේ දියණියට සිදුවූ පහරදීම පිළිබද පැමිණිල්ල 2023.08.19 දින ද විභාග කර නොමැති බවයි.

2023.08.11 දින පහරදීමක් සම්බන්ධයෙන් පොලීසිය කරන ලද පැමිණිල්ල සම්බන්ධයෙන් 2023.09.11 වන දින එනම් පහරදීම සිදුවී මාසයකට පමණ පසු ස්ථානීය නිරික්ෂණ සටහන් යොදා ඇති බව පොළොන්නරුව පොලිස් ස්ථානයේ සුළු පැමිණිලි තොරතුරු සටහන් පොතෙහි පිටුව 323 සහ ඡේදය 135 යටතේ යොදා ඇති සටහන අනුව නිරික්ෂණය වේ.

තවද, 2023.09.27 වන දින එනම්, අදාල සිදුවීමෙන් මාස එකහමාරකට පමණ පසු පොළොන්නරුව පොලිස් ස්ථානයේ නිලධාරිණියන් දෙදෙනෙකු පාසලට ගොස් පහරදීමට ලක්වූ දැරියගේ පන්තියේ සිටි වෙනත් අහඹු ලෙස තෝරා ගත් දරුවන් තිදෙනෙකුගෙන් සිදුවීම පිළිබඳව ප්‍රකාශ සටහන් කරගෙන ඇති බව පොළොන්නරුව පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා කාර්යාංශයේ දෛනික තොරතුරු සටහන් (2) පොතෙහි පිටුව 78 සහ ඡේදය 312 සහ පිටුව 162 සහ ඡේදය 74 යටතේ යොදා ඇති සටහන් අනුව නිරීක්ෂණය වේ. මෙලෙස අහඹු ලෙස තෝරා ගත් දරුවන් තිදෙනාගේ එකී ප්‍රකාශ නිරීක්ෂණය කිරීමේදී වින්දිත දැරිය වන ආර්.ජී.ඉසලි ෂෙලීනා යන අයහට පන්තිභාර ගුරුවරිය වූ 1 වන වගඋත්තරකාරිය විසින් ඔළුවට සහ පිටට අතින් පහර දී ඇති බව තහවුරු වේ.

පොළොන්නරුව මූලස්ථාන පොලීසියේ ළමා හා කාන්තා කාර්යාංශය විසින් සිදුකරන ලද විමර්ශනය අනුව වින්දිත දැරිය වන ආර්.ජී.ඉසලි ෂෙලීනා යන අයට 1 වන වගඋත්තරකාරිය විසින් පහරදීමක් සිදුකර ඇති බවට සාක්ෂි ලැබී ඇති බැවින් එම සාක්ෂි මත පදනම්ව ඇය 2023.10.10 වන දින පැය 10.30ට පොළොන්නරුව පොලිස් ස්ථානයේදී අත්අඩංගුවට ගෙන ඇත.

2023.08.11 වන දින වින්දිත දැරිය වන ආර්.ජී.ඉසලි ෂෙලීනා යන අයගෙන් රෝහලේදී ලබාගත් ප්‍රකාශය මත 2023.09.27 දින විමර්ශනයක් සිදුකර සාක්ෂි ද සටහන් කර සිදුවීම සිදුවී මාස 02කට පමණ පසු අදාල ගුරුවරිය අත්අඩංගුවට ගෙන ඇති බව අදාල පොලිස් ස්ථානයේ තොරතුරු පොත් උධෘත අනුව නිරීක්ෂණය වේ.

2023.10.10 දින අත්අඩංගුවට පත් සැකකාරියගෙන් ප්‍රකාශයක් සටහන් කරගෙන ඇති අතර, අදාල පැමිණිලිකරුගේ දරුවාට පහරනොදුන් බව ප්‍රකාශ කර ඇති බව එකී ප්‍රකාශය අනුව පෙනී යයි. එසේවුවද, වයස අවුරුදු 06ක පාසල් දැරියකට පන්තිභාර ගුරුවරිය විසින් අතින් පහරදීම සම්බන්ධයෙන් 1 වන වගඋත්තරකාරිය අංක බී 912/23/1 යටතේ අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති බවත්, 1 වන වගඋත්තරකාරිය අධිකරණය විසින් ඇප මත මුදාහැර ඇති බවත් නිරීක්ෂණය වේ.

2023.08.11 වන දින පොළොන්නරුව පොලීසිය විසින් වින්දිත දැරිය වන ආර්.ජී.ඉසලි ෂෙලීනා යන අයගෙන් පහරදීම සම්බන්ධයෙන් රෝහලේදී ලබාගත් ප්‍රකාශය මත වගඋත්තරකරුවන්ට එරෙහිව සාධාරණ කාලයක් තුල නීතිමය ක්‍රියා මාර්ග ගැනීම සඳහා පොලීසිය කටයුතු නොකළ බවටත්, 2023.08.11 දින සිට දරුවාට පාසල් යාමට නොහැකි වී ඇති බවටත්, කරුණු දන්වමින් පැමිණිලිකරු අධ්‍යාපන බලධාරීන්, දිස්ත්‍රික් ලේකම්, විදුහල්පති ඇතුළු පාර්ශවයන්ට පැමිණිලිකර ඇති බවටත් පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත යොමුකර ඇති පැමිණිල්ල මගින් සඳහන් කර ඇත.

පැමිණිලිකරුගේ දියණියට පන්තිභාර ගුරුවරිය විසින් සිදුකල පහරදීම පිළිබඳව 2023.08.11 වන දින රෝහලේ සිටියදී ලබාගෙන ඇති ප්‍රකාශය අනුව 1වන වගඋත්තරකාරියට එරෙහිව පොලීසිය ක්‍රියා මාර්ග නොගැනීම හේතුවෙන් පැමිණිලිකරු විසින් වෙනත් ආයතන වෙත පැමිණිලිකර ඇති බව නිරීක්ෂණය වේ. පැමිණිලිකරු විසින් මෙලෙස තම දරුවාට ගුරුවරියක විසින් පහරදීම නිසා පාසල්

යාමට නොහැකිවීම සම්බන්ධව ඔහු පැමිණිලි කළ ආයතන විසින් ඔහුට සාධාරණ වූ කාලයක් තුළ යුක්තිය ඉටුකරදීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය වේ. පැමිණිලිකරු විසින් 2023.09.11 වන දින මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කරන ලද මෙම පැමිණිල්ල මත පදනම්ව සිදුකරන ලද විමර්ශනය අතරතුරදී 1වන වගඋත්තරකාරියට එරෙහිව නීතිමය පියවර ගෙන අධිකරණය වෙත 2023.10.10 දින කරුණු වාර්තා කිරීමට පොළොන්නරුව මූලස්ථාන පොලිස් ස්ථානය පියවරගෙන ඇති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුගේ දරුවා පාසලට ඇතුලත් කර නොගැනීම පිළිබඳව පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත කරුණු දන්වා සිටි බැවින් පාර්ශව කැදවා 2023.12.19 වන දින කොමිෂන් සභාවේදී පරීක්ෂණයක් සිදුකිරීමට කටයුතු සිදුකරන ලද අතර, 2023.08.10 දින සිට 2023.12.18 දින දක්වා දරුවා පාසල වෙත ඇතුලත් නොකිරීමට හේතුවූ කරුණු ලෙස 2 වන වගඋත්තරකරු වන පොළොන්නරුව තෝපාවැව ජාතික පාසලේ විදුහල්පති ප්‍රකාශ කර ඇත්තේ, දරුවා පරීක්ෂා කර ඇති විශේෂඥ මනෝ වෛද්‍යවරයා විසින් ලබාදුන් නිර්දේශය මත දරුවා පාසලට රැගෙන ආ බවත්, එහිදී 1 ශ්‍රේණිය පන්තිභාර ගුරුවරුන් තිදෙනා කැදවා සාකච්ඡා කළ බවත්, ඒ අවස්ථාවේදී ගුරුවරියන් තිදෙනා ඉදිරියේ පැමිණිලිකරු ආවේගශීලී ලෙස හැසිරුණු බැවින් ගුරුවරියන් බියට පත්වූ බවත් ය. ඒ අනුව මෙම දරුවා පාසලට භාර ගැනීමෙන් පසු පීඩනයන් ඇති විය හැකි බැවින් දරුවා පාසලට ගැනීමට අකමැති වූ බවත්, සාකච්ඡාව අවසන් කිරීමට පෙර පැමිණිලිකරු පාසලෙන් පිටව ගිය බවත් 2 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කර ඇත.

2 වන වගඋත්තරකරු වන පොළොන්නරුව තෝපාවැව ජාතික පාසලේ විදුහල්පතිගේ ඉහත කී ප්‍රකාශය අනුව නිරීක්ෂණය වන්නේ, විදුහල්පති පැමිණිලිකරුගේ දරුවා නැවත පාසලට ගැනීමට අකමැති වී ඇති බවත්, පොළොන්නරුව මූලස්ථාන පොලීසිය විසින් කොමිෂන් සභාව වෙත එවා ඇති අංක 6163/23 හා 2023.12.29 දිනැති ලිපිය අනුව 2023.12.12 දින අතිරේක දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡාව අනුව දැරිය නැවත අදාල පාසල වෙත යොමු කිරීමට කටයුතු සිදුව ඇති බවත් පෙනී යයි.

**<u>නිගමනය</u>**

ඉහතින් දක්වා ඇති පරිදි පැමිණිලිකරුගේ දියණිය වන ආර්.ජී.ඉසලි ෂෙලිනා (වින්දිත දැරිය) යන අයහට 2023.08.10 වන දින පොළොන්නරුව තෝපාවැව ජාතික පාසලේ 1 ශ්‍රේණිය බී පන්ති කාමරය තුලදී ඇයගේ පන්තිභාර ගුරුවරිය වූ 1 වන වගඋත්තරකාරිය වන යූ. අනුෂා ප්‍රියංගනී ජයතිලක යන අය විසින් පහරදීමක් සිදුකර ඇති බව, පොළොන්නරුව මූලස්ථාන පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් පාසල වෙත ගොස් වින්දිත දැරිය වන ආර්.ජී.ඉසලි ෂෙලිනා යන අයගේ පන්තියේ ඉගෙනුම ලැබූ දරුවන් තිදෙනෙකුගෙන් ලබාගත් ප්‍රකාශ වලින් තහවුරු වී ඇත.

එසේම, වින්දිත දැරිය වන ආර්.ජී.ඉසලි ෂෙලිනා යන අය හට අංක 136/23 සහ 2023.08.11 දිනැති පොළොන්නරුව මහ රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරී විසින් නිකුත් කර ඇති අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව ශරීරයේ බාහිර තුවාල කිසිවක් නිරීක්ෂණය නොවුණ ද, ඇය විසින් තමාට පහරදීමක් සිදු වූ බවට සිදු කළ ප්‍රකාශය බැහැර කළ නොහැකි බවට අධිකරණ වෛද්‍යවරයා විසින් දක්වා තිබීමෙන් ඇයට රෝහල්ගතව ප්‍රතිකාර ලැබීමට එම පහරදීම හේතු වූ බවට පැමිණිලිකරු ඉදිරිපත් කර ඇති කරුණු බැහැර කළ නොහැකි බව පෙනී යයි.

තවද, පැමිණිලිකරු විසින් වින්දිත දැරිය වන ආර්.ජී.ඉසලි ෂෙලිනා යන අයව විශේෂඥ මනෝ වෛද්‍යවරයෙකු වෙත යොමු කිරීමෙන් අනතුරුව එකී විශේෂඥ මනෝ වෛද්‍යවරයා විසින් පොළොන්නරුව තෝපාවැව ජාතික පාසලේ විදුහල්පති වෙත යොමු කර ඇති 2023.09.05 දිනැති ලිපිය මගින් වින්දිත දැරිය වන ආර්.ජී.ඉසලි ෂෙලිනා යන අය ළමා මානසික අවපීඩනයෙන් පෙළෙන බවත්, දරුවා පාසල් යාමට දැඩි අකමැත්තක් දක්වන බවත්, පන්තිභාර ගුරුවරියට දැඩි බියක් දක්වන බවත් සඳහන් කර තිබීම තුළින් වින්දිත දැරියහට පහරදීමක් සිදු ව ඇති බවත්, ඇය ඉන් මානසික වශයෙන් පීඩනයට පත් ව ඇති බවත් තහවුරු වේ.

එසේහෙයින්, වින්දිත දැරිය වන ආර්.ජී.ඉසලි ෂෙලිනා යන අය හට 1 වන වගඋත්තරකාරිය වන යූ. අනුෂා ප්‍රියංගනී ජයතිලක යන අය විසින් පහරදීම් සිදුකර ඇති බව තහවුරු වී ඇති බැවින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මඟින් සුරක්ෂිත කොට ඇති "කිසිදු තැනැත්තෙකු වධහිංසාවකට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැළකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය" යන වින්දිත දැරිය වන ආර්.ජී.ඉසලි ෂෙලිනා යන අයගේ මූලික අයිතිවාසිකම 1 වන වගඋත්තරකාරිය විසින් උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

තවද, විශේෂඥ මනෝ වෛද්‍යවරයා විසින් පොළොන්නරුව තෝපාවැව ජාතික පාසලේ විදුහල්පති වෙත 2023.09.05 වන දින දරුවා සම්බන්ධයෙන් නිර්දේශ සහිත වෛද්‍ය වාර්තාවක් ලබාදී තිබියදී ඒ සඳහා එම අවස්ථාවේදීම නිසි අවධානයක් යොමු නොකොට වින්දිත දැරිය වන ආර්.ජී.ඉසලි ෂෙලිනා යන අය 2023.12.18 වන දින දක්වා පාසල වෙත ඇතුලත් කර නොගැනීමෙන් දැරිය හට මාස කිහිපයක් අධ්‍යාපනය හැදෑරීමට තිබූ කාලය අහිමි කිරීම සම්බන්ධයෙන් 2 වන වගඋත්තරකරු වන විදුහල්පතිවරයා වගකීමෙන් බැඳෙන බවත්, 2 වන වගඋත්තරකරු පාසලේ ප්‍රධානියා වන අතර 1 වන වගඋත්තරකාර ගුරුවරිය ඔහු යටතේ සේවය කරන බැවින් 1 වන වගඋත්තරකාරියගේ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් 2 වන වගඋත්තරකරු අධීක්ෂණ වගකීමෙන් බැඳෙන බව ද මෙයින් නිගමනය කරනු ලැබේ.

තවද, 1 වන වගඋත්තරකාරිය විසින් වින්දිත දැරිය වන ආර්.ජී.ඉසලි ෂෙලිනා යන අය හට සිදු කරන ලද පහරදීමෙන් ශ්‍රී ලංකාව ද පාර්ශවකරුවෙකු වන ළමා අයිතිවාසිකම් පිළිබඳව ජාත්‍යන්තර

සම්මුතියේ 37 වගන්තිය යටතේ සුරක්ෂිත ළමයින් වධහිංසාවන්ට ලක් නොවිය යුතු ය, යන අයිතිවාසිකම ද උල්ලංඝණය කර ඇති බව නිරීක්ෂණය වේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශය කර සිටී.**

01. 1 වන සහ 2 වන වගඋත්තරකරුවන්ගේ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් සුදුසු විනයානුකූල පියවර ගෙන මානව හිමිකම් කොමිෂන් සභාව වෙත වාර්තා කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කටයුතු කළ යුතු ය.

(2025)
2024. 02. 11 දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත්: 01. අමාත්‍යතුමා, - කරුණු දැනගැනීම සඳහා
අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල

02. ලේකම්, - අදාළ නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා
අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල.